# සංස්කෘතික උරුමය පිළිබඳ නූතන පාසල් පද්ධතිය තුළ සිසුන් දරන ආකල්පය හා දැනුම පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

(අනුරාධපුර දිස්ත්‍රිකයේ පාසල් පහක් ඇසුරින් )

පී.පී.එන්.ඩබ්.එම්. කුලසිංහ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ප්‍රමුඛ පදඃ උරුමය, දැනුම, ආකල්ප

## හැඳින්වීම

ස්පෘෂ හෝ අස්පෘෂ මට්ටමින් පරම්පරාවෙන් පරාම්පරාවට මිනිසා විසින් සම්මත කර ගනිමින් පවත්වාගෙන එනු ලබන්නාවූ ද දායාද කරන්නාවූ ද සියල්ල උරුමය ලෙස අර්ථකතනය කළ හැකිය. උරුමය ස්වාභාවික හා සංස්කෘතික උරුමය ලෙස වර්ග දෙකකි. මානව මැදිහත්වීමකින් තොර භෞතික පරිසරය ස්වාභාවික උරුමය ලෙස ද මානව මැදිහත්වීමක් සහිත මානව සම්මත ක්‍රියාකාරකම්, වස්තූන් හා සංකල්පයන් සංස්කෘතික උරුමය ලෙස ද හැඳින්විය හැකිය.

වත්මන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ඉතිහාසය යනු හර විෂයකි. ඒ අනුව හය ශ්‍රේණියේ සිට එකොළහ ශ්‍රේණිය දක්වා හර විෂයක් ලෙස ඉතිහාස විෂය සුවිශේෂ වන අතර වර්තමාන සංශෝධිත විෂය මාලා තුළින් මේ වන විට පුරාවිද්‍යාවේ මූලික න්‍යායාත්මක කරුණු හා සිද්ධාන්ත පිළිබඳ කරුණු ඉගෙනීමට නූතන ශිෂ්‍ය පරම්පරාව ට අවකාශය සැලසී ඇත.

දේශීය උරුමය පිළිබඳ ව සමාජ පුරවැසියන් තුළ පවතින අවම දැනුම මට්ටම උරුම කළමනාකරණය කෙරෙහි අභියෝගයක් බව කුමන සමාජයක් වුව ද පිළිගන්නා කාරණයකි. ද්විතියික අධ්‍යාපනයෙන් අනතුරුව පුරවැසියෙකු ලෙස සමාජ ගතවන පාසල් සිසුන් තුළ සංස්කෘතික උරුමය හා ස්වාභාවික උරුමය පිළිබඳ නොපහන් දැනුම මට්ටමක් පවතී නම් අප රටේ උරුමය කලමනාකරණය කෙරෙහිලා එය සෘජුවම හා වක්‍රව අතිශය ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබයි.

මෙම පර්යේෂණය හරහා වත්මන් පාසල් හි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් තුළ දේශීය උරුමය පිළිබඳ ඇති දැනුම හා ඔවුන් ඒ පිළිබඳ දක්වන ආකල්පය පිළිබඳව තක්සේරුවක් ලබා ගැනීමට අදහස් කරන අතර එම තක්සේරුව මගින් නූතන ලංකාවේ උරුමය කෙරෙහි ඔවුන් සතු දැනුම හා ආකල්ප ඇතිකරනු ලබන බලපෑම පිළිබඳ අදහසක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## අධ්‍යයන ක්‍රමවේදය

ඉහත සඳහන් කළ පර්යේෂණ අරමුණු සාක්ෂාත්කර ගැනීම උදෙසා අධ්‍යයන ක්‍රමවේදය ලෙස යොදා ගැනුනේ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත ට අයත් අනුරාධපුර දිස්ත්‍රිකයේ විවිධ මට්ටම්වලින් තෝරාගත් පාසල් කිහිපයක අහඹු ලෙස තෝරා ගත් ජ්‍යෙෂ්ඨ සිසුන් නියදියකින් තොරතුරු ලබා ගැනීමයි. ඒ සඳහා ප්‍රශ්නාවලියක් යොදා ගැනින. නියදියේ ගුණාත්මකභාවය සඳහා ජාතික පාසලක්, මධ්‍ය මහා විද්‍යාලයක්, දමිළ විදුහලක්, ග්‍රාමීය පාසලක් යනාදී ලෙස ඇතුළත් කරන ලදි. එසේ ම නියැදිය සඳහා එක්

පාසලකින් අහඹු ලෙස තෝරාගත් සිසුන් හතලිස් දෙනකු බැගින් සිසුන් දෙසීයක් යොදා ගැනින.

01 මිහින්තලේ මහා විදුහල, මිහින්තලේ

02 ස්වර්ණපාළි බාලිකා විදුහල, අනුරාධපුරය

03 සහිරා විද්‍යාලය, අනුරාධපුරය

04 අනුරාධපුර මධ්‍ය මහා විදුහල, අනුරාධපුරය.

05 ශාන්ත ජෝෂප් පිරිමි විදුහල, අනුරාධපුරය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

දේශීය උරුමය පිළිබඳ වත්මන් පාසල් සිසුන් සතු දැනුම හා ආකල්ප ඉතාම සරළ නමුත් සුවිශේෂී ප්‍රශ්න දහයක ප්‍රශ්නාවලියක් ඇසුරින් අවධානය ට ගැනිනි. උදාහරණ ලෙස එහි අන්තර්ගත වූ ප්‍රශ්නවලින් කීපයක් මෙසේ දැක්විය හැකිය.

- ඉතිහාසය විෂය ඉගෙන ගැනීම කෙරේ ඔබෙ තෘප්තිමත් ද? (බෙහෙවින් තෘප්තිමත්, තෘප්තිමත්, විශේෂත්වයක් නැත, තෘප්තිමත් නැත)
- පහත ලෝක උරුම ස්ථාන වලින් ඔබ පිවිස ඇති ස්ථාන මොනවාද?

1.සීගිරිය

2.දඹුල්ල

3.මහනුවර

4.ගාල්ල

5.නකල්ස්

- සෙනරත් පරණවිතාන මහතා පිළිබද ඔබ දන්නා එක් කරුණක් සඳහන් කරන්න.
- සංස්කෘතික හා ස්වාභාවික උරුමය ආරක්ෂා කර ගත යුත්තේ ඇයි? ඔබේ අදහස කුමක්ද?
- අහඹු ලෙස ඔබට ඓතිහාසික වැදගත්කමකින් යුතු වස්තුවක් හමු වුවහොත් ඔබ ගන්නා ක්‍රියාමාර්ගය කුමක් ද?

1.විදුහල්පති දැනුවත් කිරීම

2.විකිණීම

3.ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීම

4.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම

මේ ආකාරයේ ප්‍රශ්න හරහා දේශීය උරුමය කෙරෙහි ඔවුන් සතු ආකල්පය විමසන ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව නියදියෙන් සියයට පනහක් ඉක්මවන සැලකිය යුතු ප්‍රතිශතයක් තුළ දේශීය උරුමය පිළිබඳ අඩු අවබෝධයක් ඇති බව අනාවරණය විය. උරුම කළමණාකරණයෙහි ලා තත්කාලීන නීතිය පිළිබඳ අවම දැනුම මට්ටමකින් යුතු බව අනාවරණය වූ අතර එය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රබල අඩුපාඩුවක් ලෙස හඳුනා ගැනිනි.

ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනය නිමා කිරීමෙන් අනතුරුව සමාජගත වන පිරිසෙන් උසස් අධ්‍යාපනය කරා යොමු වන්නේ සැලකිය යුතු සීමිත ප්‍රමාණයක් බැවින් දේශිය උරුමය පිළිබඳ නිසි දැනුමක් හා ආකල්පයකින් තොරව සමාජ ගතවන කොටස හරහා උරුමය කළමනාකරණය හා සංරක්ෂණය කෙරෙහි ධනාත්මක සහයක් ලැබෙන බව විශ්වාස කිරීම අපහසුය. එම කාරණය මෙම පරීක්ෂණය මඟින් තහවුරු වන අතර පවතින

අධ්‍යාපන පද්ධතිය තුළ දේශීය උරුමය පිළිබඳ යහ ආකල්ප සංවර්ධනය කරනු ලබන මෙන්ම දැනුම සංවර්ධනය කරනු ලබන ආකර්ශණීය වැඩ පිළිවෙළක් අවශ්‍ය බව පැහැදිළි විය.

අහඹු ලෙස ඓතිහාසික වටිනාකමකින් යුත් යම් පුරා වස්තුවක් හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථානයක් හමුවූ වහාම කටයුතුකළ යුතු ආකාරය පිළිබඳ ඇති අවම අවබෝධයට පිළියම් යෙදීම දේශීය උරුමය විනාශය සම්බන්ධයෙන් වළක්වාගත හැකි තර්ජනයක් ලෙස හඳුනා ගැනිනි. පාසල් අධ්‍යාපනය මඟින් ඒ සම්බන්ධ නිවැරදි දැනුමක් හා ආකල්පයක් සමාජගත කිරීමේ ප්‍රබල අවශ්‍යතාවක් පරීක්ෂණයේ දී පැහැදිළි විය. එය උරුම සංරක්ෂණය හා කළමනාකරණය සඳහා අනාගත පරපුරේ සක්‍රීය දායකත්වය ට හේතු වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

මැන්දිස්, ඩී.ටී., ගුණරත්න, එම්.ආර්.එස්. (2016)*උරුම කළමනාකරණ ප්‍රවේශය.* පේරාදෙණිය: නෙත්වින් ප්‍රින්ටර්ස්.